# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2160/40 - 2020 ජනවාරි මස 30 වැනි බ්‍රහස්පතින්දා - 2020.01.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78 (XV) (A)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

21 වන වගන්තිය සහ 139 වන වගන්තිය සමඟ කියවිය යුතු 27(1) වන වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන වන මා විසින්, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මේ නියමය මගින් එකී පනතේ 139 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සහ එකී පනතේ 21 වන වගන්තිය යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාලයක් ලෙස සලකනු ලැබිය යුතු වූ, ශ්‍රී ලංකා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පීඨ සහ අධ්‍යයන අංශ නිශ්චිතව දක්වමින්, (2017 අප්‍රේල් මස 19 වන දින අංක 2015/46 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය මගින් අවසන් වරට සංශෝධිත) 2007 පෙබරවාරි මස 02 වන දින අංක 1482/26 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන "වෛද්‍ය පීඨය" යන අයිතමයට අනුරූපව එහි II වන තීරයේ දැක්වෙන ‘16. විකිරණවේදී අධ්‍යයන අංශය’ යන සටහනට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් සටහන එකතු කිරීමෙන් එකී නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"17. වෛද්‍ය අධ්‍යාපන අධ්‍යයන අංශය ".

ආචාර්ය බන්දුල ගුණවර්ධන,
උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍ය.

2020 ජනවාරි මස 29 වන දින,
කොළඹ දී ය.

02-270

1A - PG 4856 – 518 (2020/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*